# දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ e-Services හරහා TIN අංකය තහවුරු කර ගැනීම

**1. තම TIN අංකය මාර්ගගතව පරීක්ෂා කළ හැක්කේ කාටද?**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති තනි පුද්ගලයන්ට e-Services පහසුකම හරහා තම TIN අංකය මාර්ගගතව පරීක්ෂා කළ හැකිය.

**2. මගේ TIN අංකය පරීක්ෂා කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු කාර්යාලයකට පැමිණිය යුතුමද?**

නැත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ e-Services පහසුකම හරහා ඔබගේ TIN අංකය මාර්ගගතව පරීක්ෂා කළ හැකිය.



**3. මගේ TIN අංකය පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු මොනවාද?**

ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය (NIC අංකය) සහ විද්‍යුත් තැපැල් ලිපිනය හෝ ජංගම දුරකථන අංකය අවශ්‍ය වේ. එමෙන්ම, ඔබ වෙත එවන ලද OTP ද ඇතුළත් කළ යුතුය.

**4. මම Search ක්ලික් කළ වහාම මගේ TIN අංකය තිරය මත දිස්වේද?**

අවශ්‍ය තොරතුරු නිවැරදිව ඇතුළත් කර සත්‍යාපන ක්‍රියාවලිය සම්පූර්ණ කළ පසු, ඔබගේ TIN අංකය තිරය මත දිස්වනු ඇත.

**5. මගේ TIN අංකය මාර්ගගතව පරීක්ෂා කරන්නේ කෙසේද?**

ඔබට පහත පියවර අනුගමනය කිරීමෙන් ඔබගේ TIN අංකය පරීක්ෂා කළ හැකිය.

1. IRD වෙබ් අඩවිය – www.ird.gov.lk වෙත පිවිසෙන්න
2. ඊ - සේවාව තෝරන්න
3. ඊ - සේවාව වෙත පිවිසීම තෝරන්න
4. ලියාපදිංචි කිරීමේ සත්‍යතාව තහවුරු කිරීම මත ක්ලික් කරන්න
5. Verify Registration තෝරන්න
6. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න
7. ඔබගේ 'OTP' අංකය එවිය යුතු ජංගම දුරකථන අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත් කරන්න
8. 'Send OTP' මත ක්ලික් කරන්න
9. ඔබ වෙත එවන ලද OTP අංකය ඇතුළත් කරන්න
10. Search ක්ලික් කරන්න

**ඔබගේ TIN අංකය තිරය මත දිස්වනු ඇත**

TIN අංකය පෙන්වන්නේ නැතිද? වයස අවුරුදු 18ට වැඩි ඕනෑම අයෙකුට පහත සබැඳිය භාවිතයෙන් TIN අංකයක් ලබා ගත හැකිය.

https://eservices.ird.gov.lk/Registration/TINRegistration/ShowRequestHeader

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්